# මේ තරම් සියුමැලි ද සිගරට්



දුම්බීම, අප රටේ උපදින පරපුරද විනාශ කරන, වසර තිහක යුද්ධයෙන් විනාශ වූවාටත් වඩා පිරිසක් විනාශ කළ හා කරන භයානක පිළිලයක් බව මාධ්‍යය මඟින් හෙළි කළේය. එය හෙළි කිරීමේ මූලික අරමුණ වූයේ සෞඛ්‍යය අමතාාංශය විසින් පැකැට්ටුවේ මුද්‍රණය කරන්නට යන එහි ආදීනව පිළිබඳ රූප රාමු හා එය වළක්වාලන්නට දුම්වැටි නිපදවන සමාගම් ගත් වාරණ නීතිත් කරළියට ආ නිසාය. මෙහිදී සෞඛ්‍යය ඇමතිවරයා වන මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පියවර ප්‍රශංසීය වන අතර, පමා වී හෝ එවැනි පියවරක් ගැනීමට ඇමතිවරයාට හැකිවීම ගැන අප අගය කළ යුතුය. දුම්බීම මඟින් ඇතිවන සෞඛ්‍ය ගැටළු එහි ආදීනව දුම් බොන බොහෝ පිරිස් දනී. එහෙත් ජීවිතයට වඩා පුරුද්ද ලොකු වූ ජනතාව එම ආදීනව තඹයකට මායිම් නොකොට දුමටම ඇබ්බැහි වීම එක්තරා අතකින් එම රටේ පාපයකි. පාසල් යන කුඩා දරුවාගේ පටන් මහල්ලා දක්වා සිගරට් මිලදී ගතහැකි ක්‍රමයක් පවතින ශ්‍රී ලංකාවේ දුම්බීමේ ව්‍යාප්තිය ආරම්භ වන්නේ යටත් විජිත සමයේ සිටය. එකල පිරිමියෙක් වුවහොත් පිරිමිකම රැකගැනීමට නම් දුම්වැටියක් ඇඟිලි තුඩු අතර රැඳිය යුතු යැයි යන මතයක් තිබිණි. සුද්දන් සිගරට් පැකැට්ටුව ආදරයෙන් වැළඳගත්තේ සුද්දෙක් ලෙසට සමාජගත වීමටය. කෙසේ නමුදු එකල සිට මෙකල දක්වාම යුරෝපීය රටවල ජීවත්වන කාන්තාවන් දුම් බොන ප්‍රමාණය දෙස බැලුවිට අප රටේ කාන්තාවන් දුම් බොන්නේ නැති තරම්ය.

දුම්වැටි පැකැට්ටුවේ මුද්‍රණය කරන්නට යන එම ආදීනව රූපරාමු ශ්‍රී ලංකාවට අළුත් දෙයක් වූවාට ඕස්ට්‍රේලියාව වැනි රටක එය අළුත් දෙයක් නොවේ. බොහෝ කාලයක සිට දුම් වැටි පැකැට්ටුවේ මුද්‍රණය කර ඇති ලෙඩ රෝග වැළඳී දුක් විඳින මිනිසුන්ගේ රූප රාමු සමඟ වෙළඳසැල්වලට එන පැකැට්ටු මෙවැනි රටක අපිට හැමදාම නෙතගැටෙන දර්ශණයකි. වසර දහ අටකට වැඩි වැඩිහිටියන්ට දුම්වැටි විකුණන නීතිය අකුරටම ක්‍රියාත්මක කරන ඕස්ට්‍රේලියාවේ පුරුෂයන්ට සමගාමීව කාන්තාවන්ද දුම් බොති. බොහෝ තරබාරු කාන්තාවන් හා පිරිමින් තමන්ගේ ආහාර වේල වෙනුවට චොක්ලට් පෙත්තක් හා කොකාකෝලා කෑන් එකක් බී දුම්වැටියක් දල්වා ගන්නා අයුරු මා බොහෝ විට දැක ඇත. ඔවුන් කුසගින්න පාලනය කරන්නේ දුම්බීමෙනි. එහෙයින් කෙතරම් ඡායාරූප පැකට්ටුවේ මුද්‍රණය කළද ඔවුහු උදේ සිට රෑවනතුරු දුම් බොති. එම ඡායාරූප දුටු විට දුම්බීම තබා දුම්වැටියක් දෙස ඇහැක් ඇර බලන්නට තරම් ප්‍රියක් මට නම් උපදින්නේ නැත. මේ කුණු ශරීරයට දුක් දෙමින් ජීවත් වීම දුකක් ලෙසම දකින්නට සිතෙන ඡායාරූප දෙස නොබලාම පැකැට්ටුව බින් එකට විසිකරන එම ඇබ්බැහිවූවන් දුම්කොළ සමාගම් වලට කෝටි ප්‍රකෝටි ගණන් මුදල් හරි හම්බ කර දෙන්නේ තමන්ගේ ශරීරය පිළිබඳ අල්ප මාත්‍රයකුදු ආදරයක් නොතබාය. එහෙයින් එම ඡායාරූප මුද්‍රණය කළා යැයි කියා, එයින් කිසිම අවාසියක් දුම් කොළ සමාගම් මුහුණ දී නැත. ඔවුන් පෙර පරිදිම තම ව්‍යාපාරය කරගෙන යයි. රජයට බදු මුදල් ගෙවයි.

එසේනම් ලංකාවේ දුම්කොළ සමාගම් මෙයට බියවී නීති මඟට බැස්සේ ඇයි? එයට හේතු ගණනාවක් තිබේ. එයින් එක හේතුවක් නම් අපරටේ තවමත් දුම්වැටි පාවිච්චි කරන්නේ මධ්‍යම පාන්තිකයන් හා අන්ත අසරණ දිළින්දන් වීමයි. එහි ආදීනව අසනවාට වඩා දැකීමෙන් එවැනි ජනතාව බියට පත්වී දුම්බීම පාලනය කරගතහොත් යන බිය දැනී ඔවුන් මෙම වාරණයට ගියා විය හැක. කුඩු පාවිච්චි කරන කුඩ්ඩෝ පවා එහි ආදීනව දන්නා නූතන කාලෙක සිගරට් පැකැට්ටුවේ වර්ණ ඡායාරූප වලට මනසට කළ හැකි බලපෑම කුමක්ද යන ප්‍රශ්නය අපට මතුවේ. එසේ නම් දුම් බොන්නාට වඩා දුම් බොන පුද්ගලයාගේ පවුල් සංස්ථාවට අත්වන මෙම ලෙඩ දුක් ඡායාරූප යෑමෙන් වෙන කැළඹීම දැක ඔවුන් බිය වූවා විය හැක. මන්ද? පවුල හා දරුවන් සමඟ බැඳී ඇති පීඩිත හා මධ්‍යම පාන්තික පවුල් වලට දුම් බොන්නට වියදම් කරන මුදල් ඉතිරි කර ගතහොත් එයින් ශරීරයට මෙන්ම පවුලේද ආර්ථික අමාරුකම් වලට සිදුවන සේවය පිළිබඳව දැනී එන බිය අරුම පුදුම බියක් නොවන නිසාය.

සෑම අයවැයකින්ම වාගේ දුම්වැටිවල මිල ඉහළ යවන බව අපි දනිමු. එම මුදල් බොහොමයක් බදුය. දුම්කොළ සමාගම් විසින් රජයට ගෙවන මේ බදුවලින් රජයේ දූෂණ නාස්තිය යෙදෙන මුදල් වලටද මේ බදු මුදල් යොදවයි. සංවර්ධනයටද යොදවයි. එනිසා මුදල් අමාත්‍යාංශයට හා ඇමතිවරයාට දුම් බොන්නන් වසරක් පාසා ගෙන එන්නේ අසිරි සිරියකි. එහෙත් දුම් බී ලෙඩ වෙන වසර ගණනාවක් ප්‍රතිකාර කරන්නට සිදුවන ලෙඩ රෝගවලට ගොදුරු වන පිරිස්වලට ප්‍රතිකාර කරන්නට සිදුවන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයටය. එම අමාත්‍යාංශය ලාභ ලබන අමාත්‍යාංශයක් නොවේ. ජනතාවට සේවය කරන අමාත්‍යාංශයකි. එහෙයින්, හදවත් ඇස් වකුගඩු පෙනහැලි ආදී අවයව දිය කරන භයානක රෝග ප්‍රතිකාරවලට යන මුදල් ප්‍රමාණය සළකා බැලු කළ බදු මුදල් වලට වඩා වැඩි ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වියදම් කරයි.

එසේම මත්පැන් වලින්ද මේ ආදීනව සිදුවේ. එසේ නම් මත්පැන් බෝතල්වලටද මෙවැනි ඡායරූප මත් ලෝලීන්ට දර්ශණය වන පරිදි මුද්‍රණය කරන්නට සෞඛ්‍ය ඇමතිවරයා තීරණය නොකරන්නේ මන්දැයි යන ගැටළුව අපට පැන නගී. දුම්වැටි සේම මත්පැන්ද රජයට ආදායම් හා බදු මුදල් ලබාදෙන ප්‍රධාන මාර්ගයකි. රජයටම අයත් ඉස්කාගාර සංස්ථා පැවතියේ අප රටේය. එසේම ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව




අප රට මත්පැන් බීම අතින් හතරවෙනි ස්ථානයට පැමිණ තිබේ. එහෙත් මත්පැන් හල් විවාත කිරීමට බලපත් ලබා දෙන්නේද රජයමයි. සෞඛ්‍යය ඇමතිවරයාට දුම්වැටි වලට ගත් තීරණය සේම මත් බෝතලයටද ගත හැකි නම් අපි ඔහුට තව තවත් ප්‍රශංසා කරමු. එයද මතට දෙන ලොකු තිතකි.

මීට කලකට පෙර මත්පැන් බී ලෙඩවෙන පුද්ගලයන්ගෙන් රුපියල් දෙසීය පනහක වැනි මුදලක් ප්‍රතිකාර ලබා ගැන්මට ඒමේදී අය කිරීමට සෞඛ්‍යය අමැතිවරයා තීරණය කළ බව මට මතකය. එහෙත් එය ක්‍රියාත්මකද යන්න අපි නොදනිමු. එසේම සිගරට් පැකැට්ටුවේ ලෙඩරෝග ආදීනව ඡායාරූප මුද්‍රණය ද තවම ඇත්තේ උසාවි තීරණයක් මතය. එයද වේවිද




නොවේවිද අපි නොදනිමු. එසේම ඔහුගේ පුත් දහම් සිරිසේන පාසිකුඩා හිදී ඇතිකරගත් ගැටුම හේතුකරගෙන මුහුණ දුන් අවස්ථාවේ ඔහු මාධ්‍යයට අළුත්ම රහසක් හෙළි කළේය. ඒ තමන් ඝාතනය කිරීමට සැලසුම් කර ඇති බවයි. එසේ නම් ඔහුව ඝාතනය කරන්නට සූදානම් වන්නේ අධිරාජ්‍යවාදී දුම්කොළ සමාගම් ද, නැත්නම් අගමැතිකමට පොරකන රජයේම පිරිස්ද යන්න මේ වනතුරු රහසක්ය. ඇමතිවරයාද එය බාගෙට ජනතාව වෙත හෙළිකර නිසොල්මන්ව සිටී.

අපි ඇමතිවරයා ගන්නට යන තීරණයට ප්‍රශංසා කරමු. එසේම එය බාගෙට හකුළා ගෙන මුනිවත රකින පිළිවෙතක් අනුගමනය කළහොත් අපට තීරණය කරන්නට සිදු වන්නේ ඔහු මරණ බයට මෙවැනි දෙයක් හකුළාගත් බවකි. මන්ද, අතීතයේ මෙන්ම වර්තමානයේ ද අප රටේ එවැනි දේවල් ඕනෑතරම් සිදුවන නිසාය. මහාචාර්ය සේනක බිබිලේගේ ඖෂධ ප්‍රතිපත්තිය හ ඔහුව ඝාතනය කිරීම එයට එක් නිදසුනකි. එසේම බොකු බඩවැල් දමා මුද්‍රණය කර පෙන්නුවද දුම් බීමට ඇබ්බැහිවූවන් අඩුවනු යැයි අපිට සිතිය නොහැකිය. මත්පැන්ද එසෙමය. බුද්ධියට වඩා හැඟීම්වලට පුරුද්දට වහල් වී සිටින ජනතාවක් සිටින රටකට සිරිසේන ඇමතිවරයාට කළ හැකි හොඳම කාර්යභාරය වන්නේ පොළොන්නරුව පළාතේ අංග සම්පූර්ණ රෝහලක් සෑදීමය. එය හම්බන්තොට වරාය මෙන් නැව් නොඑන වරායක් නොව, ලෙඩුන් දස දහස් ගණන් ප්‍රතිකාර ගන්නා රෝහලක් වන බව නම් සිකුරුය. එය ණය නොගෙන මතෙන් තෙත්වන දුමෙන් රත්වෙන ජනතාවගේම බදු මුදල් වලින් සාදා නිම කරගත හැකිනම් කොතරම් අගනේද???

ProSmile
Dental Surgery

General and Cosmetic Dentistry

Dr Anne Perera (BDSc)

2A Montasell Avenue
Deer Park Vic 3023

Telephone: (03) 8390 4055

Clinic Hours: Monday - Friday
9:00am - 5:00pm